A



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2016**

| | | |
|---|---|---|
| ඉතිහාසය I (I කොටස)<br>வரலாறு I (பகுதி I)<br>History I (Part I) | **25 S I** | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

**විභාග අංකය:** ..................................

**උපදෙස්:**

* මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු, නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
* මෙම කොටසට ලකුණු **40** ක් දෙනු ලැබේ.
* කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

* අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) කළු ගඟ (2) මහවැලි ගඟ (3) අඹන් ගඟ
(4) වලවේ ගඟ (5) කැලණි ගඟ (.........)

**2.** (1) තැප්‍රොබේන් (2) පලෙසිමුන්ඩු (3) සෙරන්ඩිබ්
(4) ජනනාථ-මංගලම් (5) සෙයිලාන් (.........)

**3.** (1) මාතොට (2) ඌරාතොට (3) ගෝකණ්ණ
(4) ජම්බුකෝලපට්ටන (5) කොරතොට (.........)

**4.** (1) සේන-ගුත්තික (2) අසේල (3) එළාර
(4) බුද්දපාරින්ද (5) මාඝ (.........)

**5.** (1) දන්තුරේ සටන (2) බලන සටන (3) රන්දෙනිවෙල සටන
(4) ගන්නොරුව සටන (5) කටුවන සටන (.........)

* අංක **6** සිට **10** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ.** එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**6.** (1) ඩි මුන්ඩෝ - ඇරිස්ටෝටල්
(2) භූගෝල ශාස්ත්‍රය (Geographia) - ටොලමි
(3) ටොපොග්‍රැෆියා ක්‍රිස්ටියානා - කොස්මස්
(4) ලංකාධිපත්‍යය (The Temporal and Spiritual Conquest of Ceylon) - ෆ්‍රැන්සිස් වැලන්ටයින්
(5) යාල්පාන වෛපව මාලෛ - මයිල්වාගනම් (.........)

**7.** (1) මහින්ද හිමි - දේවානම්පිය තිස්ස රජතුමා
(2) හේමමාලා-දන්ත කුමරු - සිරිමේඝවණ්ණ රජතුමා
(3) බුද්ධඝෝෂ හිමි - බුද්ධදාස රජතුමා
(4) ෆාහියන් - මහානාම රජතුමා
(5) උපාලි හිමි - කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (.........)

**8.** (1) ජෝරිස් ෆන් ස්පිල්බර්ජන් - පළමුවැනි විමලධර්මසූරිය රජතුමා
(2) ජෝන් පයිබස් - කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
(3) හියු බොයිඩ් - දෙවැනි රාජසිංහ රජතුමා
(4) රොබට් ඇන්ඩෲස් - රාජාධි රාජසිංහ රජතුමා
(5) මැක්ඩොවල් - ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (.........)

[දෙවැනි පිටුව බලන්න.

**9.** (1) අඹන්වෙල රාලගේ කැරැල්ල - යාන් ෂ්‍රොයිඩර්
(2) 1817-18 බ්‍රිතාන්‍ය විරෝධී සටන - රොබට් බ්‍රවුන්රිග්
(3) 1848 බ්‍රිතාන්‍ය විරෝධී සටන - ටොරිංටන්
(4) 1883 කොටහේන කෝලාහලය - ජේම්ස් ලොංඩන්
(5) 1915 සිංහල-මුස්ලිම් කෝලාහලය - රොබට් චාමර්ස් (………)

**10.** (1) වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමි - පරම ධම්ම චේතිය පිරිවෙන
(2) ආරුමුග නාවලර්තුමා - වන්නාර්පන්නෙයි සයිව ප්‍රගාස විද්‍යාසාලෙයි
(3) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි - විද්‍යෝදය පිරිවෙන
(4) රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමි - විද්‍යාලංකාර පිරිවෙන
(5) ටී. බී. ජයා - සහිරා විද්‍යාලය (………)

- අංක **11** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන/දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ**. **Y** තීරුව, **X** තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**11.**

| X | Y |
|---|---|
| (i) මිරිසවැටි දාගැබ | A පළමුවැනි පරාක්‍රමබාහු රජතුමා |
| (ii) අභයගිරි දාගැබ | B පළමුවැනි රාජසිංහ රජතුමා |
| (iii) ගල් විහාරය | C හතරවැනි බුවනෙකබාහු රජතුමා |
| (iv) ගඩලාදෙණිය | D දුට්ඨගාමණී අභය රජතුමා |
| (v) බැරැන්ඩි කෝවිල | E වට්ටගාමණී අභය රජතුමා |

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC (………)

**12.**

| X | Y |
|---|---|
| (i) මිහින්තලේ පුවරු ලිපිය | A වෙළෙඳ මධ්‍යස්ථානයක පාලනය පිළිබඳ නීති රීති |
| (ii) වේවැල්කැටිය සෙල්ලිපිය | B බුදල්නාවන් හට ප්‍රදානය කරන ලද වරප්‍රසාද |
| (iii) බදුලු ටැම් ලිපිය | C පළමුවැනි පරාක්‍රමබාහු රජතුමා සහ දෙවැනි ගජබාහු රජතුමා අතර ඇති කරගත් ගිවිසුම |
| (iv) පනාකඩු තඹ සන්නස | D ග්‍රාමීය අධිකරණ කටයුතු පිළිබඳ නීති රීති |
| (v) සංගමු විහාර සෙල්ලිපිය | E විහාරගම් පාලනය පිළිබඳ නීති රීති |

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC (………)

**13.**

| X | Y |
|---|---|
| (i) මල්වාන ගිවිසුම | A කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා සහ ලන්දේසීන් අතර ඇති කරගත් ගිවිසුම |
| (ii) 1638 ගිවිසුම | B ඩී. එස්. සේනානායක සහ බ්‍රිතාන්‍ය ආණ්ඩුව අතර ඇති කරගත් ගිවිසුම |
| (iii) 1766 ගිවිසුම | C කෝට්ටේ ප්‍රධානීන් සහ පෘතුගීසීන් අතර ඇති කරගත් ගිවිසුම |
| (iv) 1815 උඩරට ගිවිසුම | D දෙවැනි රාජසිංහ රජතුමා සහ ලන්දේසීන් අතර ඇති කරගත් ගිවිසුම |
| (v) 1947 ආරක්ෂක ගිවිසුම | E උඩරට ප්‍රධානීන් සහ බ්‍රිතාන්‍යයන් අතර ඇති කරගත් ගිවිසුම |

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC (………)

**14.**

| X | Y |
|---|---|
| (i) මහ බද්ද | A අලි ඇතුන් පිළිබඳ කාර්යාංශය |
| (ii) කොට්ටල් බද්ද | B විවීම් පිළිබඳ කාර්යාංශය |
| (iii) කුරුවේ බද්ද | C ප්‍රවාහන කාර්යාංශය |
| (iv) මඩිගේ බද්ද | D කුරුඳු දෙපාර්තමේන්තුව |
| (v) කින්නර බද්ද | E ශිල්පීන් පිළිබඳ කාර්යාංශය |

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC (………)

15.

| | X | | Y |
|---|---|---|---|
| (i) | ලංකා සමසමාජ පක්ෂය | A | එස්. ඒ. වික්‍රමසිංහ |
| (ii) | බොල්ෂෙවික් ලෙනිනිස්ට් පක්ෂය | B | ජී. ජී. පොන්නම්බලම් |
| (iii) | කොමියුනිස්ට් පක්ෂය | C | එස්. ජේ. වී. චෙල්වනායගම් |
| (iv) | ද්‍රවිඩ කොංග්‍රසය | D | කොල්වින් ආර්. ද සිල්වා |
| (v) | ෆෙඩරල් පක්ෂය | E | එන්. එම්. පෙරේරා |

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC (.........)

- අංක **16** සිට **20** තෙක් සෑම ප්‍රශ්නයකට ම ගැළපෙන පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**16. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හා සම්බන්ධ පහත දැක්වෙන මූලාශ්‍ර රචිත කාලය අනුව ඒවායේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ කවර වරණයේ ද?**

(1) දීපවංසය, මහාවංසය, පූජාවලිය, වංසත්ථප්පකාසිනී, රාජාවලිය
(2) දීපවංසය, පූජාවලිය, මහාවංසය, වංසත්ථප්පකාසිනී, රාජාවලිය
(3) දීපවංසය, මහාවංසය, වංසත්ථප්පකාසිනී, පූජාවලිය, රාජාවලිය
(4) දීපවංසය, මහාවංසය, වංසත්ථප්පකාසිනී, රාජාවලිය, පූජාවලිය
(5) මහාවංසය, දීපවංසය, වංසත්ථප්පකාසිනී, පූජාවලිය, රාජාවලිය (.........)

**17. රෝහණ පාලකයන්ගේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?**

(1) මහානාග, යට්ඨාලක තිස්ස, ගෝඨාභය, කාකවණ්ණ තිස්ස, දුට්ඨගාමණී අභය
(2) මහානාග, ගෝඨාභය, යට්ඨාලක තිස්ස, කාකවණ්ණ තිස්ස, දුට්ඨගාමණී අභය
(3) මහානාග, ගෝඨාභය, කාකවණ්ණ තිස්ස, යට්ඨාලක තිස්ස, දුට්ඨගාමණී අභය
(4) මහානාග, කාකවණ්ණ තිස්ස, දුට්ඨගාමණී අභය, ගෝඨාභය, යට්ඨාලක තිස්ස
(5) මහානාග, යට්ඨාලක තිස්ස, කාකවණ්ණ තිස්ස, දුට්ඨගාමණී අභය, ගෝඨාභය (.........)

**18. මධ්‍යතන ශ්‍රී ලංකාවේ අග නගරවල නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?**

(1) දඹදෙණිය, කුරුණෑගල, යාපහුව, ගම්පොළ, කෝට්ටේ
(2) දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ
(3) කුරුණෑගල, දඹදෙණිය, යාපහුව, ගම්පොළ, කෝට්ටේ
(4) යාපහුව, දඹදෙණිය, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ
(5) දඹදෙණිය, යාපහුව, ගම්පොළ, කුරුණෑගල, කෝට්ටේ (.........)

**19. බ්‍රිතාන්‍ය පාලනය යටතේ ඇති කරන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?**

(1) කෝල්බෘක්, මැකලම්, ඩොනමෝර්, මැනිං, සෝල්බරි
(2) කෝල්බෘක්, මැනිං, මැකලම්, ඩොනමෝර්, සෝල්බරි
(3) කෝල්බෘක්, ඩොනමෝර්, මැනිං, මැකලම්, සෝල්බරි
(4) කෝල්බෘක්, මැනිං, ඩොනමෝර්, මැකලම්, සෝල්බරි
(5) කෝල්බෘක්, මැකලම්, මැනිං, ඩොනමෝර්, සෝල්බරි (.........)

**20. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විපක්ෂ නායකවරුන්ගේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත සඳහන් කවර වරණයේ ද?**

(1) එන්. එම්. පෙරේරා, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක, සිරිමාවෝ බණ්ඩාරනායක, ඩඩ්ලි සේනානායක, ජේ. ආර්. ජයවර්ධන
(2) එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක, එන්. එම්. පෙරේරා, සිරිමාවෝ බණ්ඩාරනායක, ඩඩ්ලි සේනානායක, ජේ. ආර්. ජයවර්ධන
(3) එන්. එම්. පෙරේරා, ජේ. ආර්. ජයවර්ධන, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක, සිරිමාවෝ බණ්ඩාරනායක, ඩඩ්ලි සේනානායක
(4) එන්. එම්. පෙරේරා, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක, ඩඩ්ලි සේනානායක, සිරිමාවෝ බණ්ඩාරනායක, ජේ. ආර්. ජයවර්ධන
(5) එන්. එම්. පෙරේරා, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක, ජේ. ආර්. ජයවර්ධන, සිරිමාවෝ බණ්ඩාරනායක, ඩඩ්ලි සේනානායක (.........)

[හතරවැනි පිටුව බලන්න.

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ**. එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. ජේතවනාරාමය**

(1) ජේතවනාරාමය මහසෙන් රජතුමා විසින් කරවන ලදී.
(2) ජේතවනාරාමය මහාවිහාර සීමාව තුළ පිහිටුවන ලදී.
(3) සාගල භික්ෂුවට ජේතවන විහාරය පූජා කරන ලදී.
(4) ජේතවන දාගැබ ශ්‍රී ලංකාවේ විශාලතම ස්තූපය වේ.
(5) ජේතවන නිකාය, ජේතවන විහාරය කේන්ද්‍ර කරගෙන ආරම්භ විය. (………)

**22. ධාතුසේන රජතුමා**

(1) දෙමළ පාලකයන් පරාජය කොට ධාතුසේන කුමාරයා සිහසුනට පත් විය.
(2) ධාතුසේන රජතුමා ලම්බකණ්ණ පෙළපතට අයත් විය.
(3) මහානාම හිමි ධාතුසේන රජතුමාගේ මාමා විය.
(4) ධාතුසේන රජතුමා කලාවැව ඉදිකරවීය.
(5) කාශ්‍යප රජු විසින් ධාතුසේන රජතුමා මරණයට පත් කරන ලදී. (………)

**23. කෝට්ටේ රාජධානිය**

(1) නිශ්ශංක අලකේශ්වර කෝට්ටේ බලකොටුව ගොඩනැංවී ය.
(2) පස්වැනි බුවනෙකබාහු රජතුමා කෝට්ටේ පළමුවැනි පාලකයා ලෙස සලකනු ලැබේ.
(3) කෝට්ටේ ශ්‍රේෂ්ඨතම පාලකයා හයවැනි පරාක්‍රමබාහු රජතුමා ය.
(4) දෙවන රාජසිංහ රජතුමා කෝට්ටේ නගරය විනාශ කළේ ය.
(5) ධර්මපාල රජතුමා තෑගි ඔප්පුවක් මගින් කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන්ට පවරා දුන්නේ ය. (………)

**24. කෝල්බෲක්-කැමරන් කොමිසමේ යෝජනා**

(1) ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීම
(2) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම
(3) රාජකාරිය අවලංගු කිරීම
(4) ඒකීය අධිකරණ ක්‍රමයක් ඇති කිරීම
(5) මුළු දිවයින ම පළාත් නවයකට බෙදීම (………)

**25. දහනව වන සියවසේ දෙවන භාගයේ ඇති වූ සංස්කෘතික පුනර්ජීවනය**

(1) සංස්කෘතික පුනර්ජීවනය මූලික වශයෙන් ක්‍රිස්තියානි මිෂනාරි කටයුතුවලට එරෙහි ප්‍රතික්‍රියාවක් ලෙස ආරම්භ විය.
(2) බෞද්ධ පුනර්ජීවනය බොහෝ දුරට බස්නාහිර සහ දකුණු පළාත් කේන්ද්‍ර කරගෙන පැවතුණි.
(3) පරම විඥානාර්ථ සමාගම බෞද්ධ පුනර්ජීවනයෙහි ලා වැදගත් කාර්යභාරයක් ඉටු කළේ ය.
(4) ප්‍රථම බෞද්ධ පාසල, වලිසිංහ හරිස්චන්ද්‍ර විසින් පිහිටුවන ලදී.
(5) ඉස්ලාම් පුනර්ජීවනයේ ඉතාමත් ම වැදගත් නායකයා එම්. සී. සිද්දි ලෙබ්බේ ය. (………)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ……………………………………… **1** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ……………………………………… **2** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ……………………………………… **3** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ……………………………………… **4** ද,
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ……….. **5** ද **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් නිවැරදි ය. |

**26. පොළොන්නරු රාජධානියේ බිඳවැටීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) චන්ද්‍රබානුගේ ආක්‍රමණයෙන් සිදු වූ විනාශය
(B) සාගත
(C) කාලිංග හා පාණ්ඩ්‍ය පෙළපත් අතර ගැටුම
(D) දුර්වල පාලකයන් බලයට පත් වීම (………)

**27. පෘතුගීසීන් සහ යාපනය රාජධානිය**

(A) යාපනය රාජධානියේ අවසාන පාලකයා දෙවැනි සංකිලි ය.
(B) 1619 දී පෘතුගීසීන් විසින් යාපනය ජයග්‍රහණය කරන ලදී.
(C) කොන්ස්තන්තීනු ද බ්‍රැගන්සා යාපනයේ ආණ්ඩුකාරවරයා ලෙස පත් කරන ලදී.
(D) පෘතුගීසීහු හින්දු ආගමට අනුග්‍රහය දැක්වූහ. (………)

**28. මුහුදුබඩ පළාත්වල ලන්දේසි පරිපාලනය**

(A) ශ්‍රී ලංකාවේ ලන්දේසි පාලන ප්‍රදේශ, ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම විසින් පරිපාලනය කරන ලදී.
(B) ශ්‍රී ලංකාවේ ලන්දේසි පාලන ප්‍රදේශ කපිතාන් ජෙනරාල්වරයකු විසින් පාලනය කරන ලදී.
(C) ලන්දේසි පෙරදිග අධිරාජ්‍යයේ මූලස්ථානය බතාවියාවේ පිහිටුවා තිබිණි.
(D) ශ්‍රී ලංකාවේ ලන්දේසි පාලන ප්‍රදේශය කොමාන්ඩරි පහකට බෙදා පැවතිණි. (………)

**29. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා**

(A) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා උඩරට රාජධානියේ අවසාන පාලකයා විය.
(B) උඩරට සිංහාසනයට පත් වීමට පෙර ශ්‍රී වික්‍රම රාජසිංහ, කන්නසාමි නම් විය.
(C) ඔහු සිහසුනේ තැබීමට පිළිමතලව්වේ මහාධිකාරම මූලිකත්වය ගත්තේ ය.
(D) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා පත්තිරිප්පුව ඉදි කරවී ය. (………)

**30. අමද්‍යප ව්‍යාපාරය**

(A) ඩී. බී. ජයතිලක අමද්‍යප සංවිධානයේ ප්‍රථම සභාපතිවරයා විය.
(B) යටත් විජිත ආණ්ඩුවේ සුරාබදු ප්‍රතිපත්තියට එරෙහිව අමද්‍යප ව්‍යාපාරය ආරම්භ විය.
(C) සේනානායක පවුලේ සාමාජිකයෝ අමද්‍යප ව්‍යාපාරයේ ප්‍රධාන ආධාරකරුවන් වූහ.
(D) අමද්‍යප ව්‍යාපාරයෙන් නැගී ආ විරෝධය හමුවේ ආණ්ඩුව සිය සුරාබදු ප්‍රතිපත්තිය වෙනස් කළේ ය.

(………)

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31. මහාවංසයට අනුව විජය රජතුමාගේ අගනුවර කුමක් ද?**

(1) සිරීසවත්ථුපුර (2) අනුරාධපුර (3) ලංකාපුර
(4) උපතිස්සගාම (5) තම්බපණ්ණි (………)

**32. ලම්බකණ්ණ පෙළපතේ පළමුවන පාලකයා කවුද?**

(1) සුභ (2) වසභ (3) ගජබාහු
(4) ගෝඨාභය (5) ධාතුසේන (………)

**33. පළමුවැනි පරාක්‍රමබාහු රජතුමාගේ රාමඤ්ඤ දේශ ආක්‍රමණය පිළිබඳ ව සඳහන් වන සෙල්ලිපිය කුමක් ද?**

(1) තිරුවලංගාඩු සෙල්ලිපිය (2) අඹගමුව සෙල්ලිපිය
(3) ගල් විහාර සෙල්ලිපිය (4) දෙවනගල සෙල්ලිපිය
(5) රාමේෂ්වරම් සෙල්ලිපිය (………)

**34. යාපහුව රාජධානියේ පළමුවන පාලකයා කවුද?**

(1) තුන්වැනි විජයබාහු රජතුමා (2) දෙවැනි පරාක්‍රමබාහු රජතුමා
(3) පළමුවැනි බුවනෙකබාහු රජතුමා (4) තුන්වැනි පරාක්‍රමබාහු රජතුමා
(5) දෙවැනි බුවනෙකබාහු රජතුමා (………)

**35. ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටුවන ලද්දේ කුමන ආණ්ඩුකාරවරයාගේ පාලන සමයේ දී ද?**

(1) ෆ්‍රෙඩ්රික් නෝර්ත් (2) තොමස් මේට්ලන්ඩ් (3) රොබට් බ්‍රවුන්රිග්
(4) විල්මට් හෝර්ටන් (5) ස්ටුවට් මැකෙන්සි (………)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | පළමුවන නිකාය භේදය වට්ටගාමණී අභය රාජ්‍ය සමයේ දී සිදු විය. | මහායාන ධර්මය, කුටකණ්ණ තිස්ස රාජ්‍ය සමයේ දී ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. | (.........) |
| **37.** | මහාසේන රජතුමා යෝධවැව ඉදි කරවී ය. | මාස පළවා හැරි තුන්වැනි විජයබාහු රජතුමා දඹදෙණිය සිය පාලන මධ්‍යස්ථානය බවට පත් කර ගත්තේ ය. | (.........) |
| **38.** | හයවැනි පරාක්‍රමබාහු රජතුමා චෙං හෝ පරාජයට පත්කොට ශ්‍රී ලංකාව එක්සේසත් කළේ ය. | පෘතුගීසි පාලනයෙන් උද්ගත වූ වඩාත් කැපීපෙනෙන ප්‍රතිඵලය වූයේ රෝමානු කතෝලික ආගම හඳුන්වා දීමයි. | (.........) |
| **39.** | පෘතුගීසීහු ඇතැම් ස්වදේශීය සමාජ හා ආර්ථික ආයතන ස්වකීය ආර්ථික වාසිය සඳහා උපයෝගී කරගත්හ. | පෘතුගීසීහු සාම්ප්‍රදායික ඉඩම් භුක්ති, කුල හා රාජකාරි ක්‍රම දිගට ම පවත්වාගෙන යමින් ඒවා කුරුඳු හා අනෙකුත් ද්‍රව්‍ය අඩු මිලට ලබා ගැනීම සඳහා උපයෝගි කර ගත්හ. | (.........) |
| **40.** | ලංකා ජාතික සංගමයේ නියෝජිත පිරිස සර්වජන ඡන්ද බලය ප්‍රදානය නො කළ යුතු යැයි ඩොනමෝර් කොමිසම ඉදිරියේ කියා සිටියහ. | 1964 දී බණ්ඩාරනායක මැතිණිය ශ්‍රී ලංකාවේ ඉන්දියානු වතු කම්කරුවන් පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉන්දීය අගමැති ලාල් බහදූර් ශාස්ත්‍රී සමග ගිවිසුමකට එළඹියා ය. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ඉතිහාසය I (II කොටස)
வரலாறு I (பகுதி II)
History I (Part II)

25 S I

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

**උපදෙස්:**

✳ **පළමුවන** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න**. ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.
   (i) යාපනය නගරය (ii) සේනානායක සමුද්‍රය (iii) කතරගම (iv) උතුරු මැද පළාත
   (v) කදම්බ නදිය (vi) මහියංගණය (vii) කල්පිටිය (viii) කොළඹ
   (නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි; කෙටි ඓතිහාසික සටහනකට ලකුණු **05** බැගිනි)

2. ක්‍රි.ව. දහතුන්වන සියවසේ අවසානය දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩගැස්වීම කෙරෙහි භූගෝලීය සාධක බලපෑ අයුරු පහත සඳහන් ඕනෑ ම මාතෘකා **දෙකක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න.
   (i) මධ්‍යම කඳුකරය
   (ii) ගංගා
   (iii) ඉන්දියාවට ආසන්නව පිහිටීම (එක් කොටසකට ලකුණු **07** බැගිනි)

3. "දේවානම්පිය තිස්ස රාජ්‍ය සමය දේශපාලන මෙන් ම සංස්කෘතික ක්ෂේත්‍රයේ ද අතිශයින් වැදගත් අවධියකි."
   (i) දේවානම්පිය තිස්ස රජතුමාට සමකාලීනව ඉන්දියාවේ සිටි මෞර්ය පාලකයා නම් කරන්න. (ලකුණු 01යි)
   (ii) මිහිඳු හිමියන් සමග ලංකාවට වැඩම කළ භික්ෂූන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02යි)
   (iii) මහින්දාගමනයට පෙර ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ව පැවැති ආගමික විශ්වාස සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 03යි)
   (iv) දේවානම්පිය තිස්ස රාජ්‍ය සමයේ දේශපාලන හා සංස්කෘතික වැදගත්කම විචාරාත්මක ව විමසන්න. (ලකුණු 08යි)

4. රජරට ශිෂ්ටාචාර අවධියේ වාරිමාර්ග ක්‍රමයේ ඇති වූ වර්ධනය පහත සඳහන් අංශ ඇසුරෙන් පරීක්ෂා කරන්න.
   (i) වැව් ඉදිකිරීමේ ක්‍රමික වර්ධනය
   (ii) වාරි තාක්ෂණය (ලකුණු 14යි)

5. "නිශ්ශංකමල්ල රජතුමා අභියෝග රැසකට මුහුණ දුන් පාලකයෙකි."
   (i) නිශ්ශංකමල්ල රජතුමා කුමන රාජ වංශයකට අයත් වී ද? (ලකුණු 01යි)
   (ii) ඔහුට පෙර, රට එක්සේසත් කොට පොළොන්නරුවේ සිට පාලනය මෙහෙයවූ රජවරුන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02යි)
   (iii) නිශ්ශංකමල්ල රජතුමාගේ සංස්කෘතික සේවය සැකෙවින් දක්වන්න. (ලකුණු 03යි)
   (iv) නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග සැකෙවින් දක්වා, ඔහු ඒවා ජයගත් අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 08යි)

6. (i) උඩරට රාජ්‍යය ආක්‍රමණය කිරීමට පෘතුගීසීන් පෙලඹවූ සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 06යි)
   (ii) එම ආක්‍රමණ අසාර්ථක වූයේ මන් ද? (ලකුණු 08යි)

7. 1848 බ්‍රිතාන්‍ය විරෝධී අරගලය ඇතිවීමට තුඩු දුන් ප්‍රධාන සාධක විවේචනාත්මක ව විමසන්න. (ලකුණු 14යි)

[ අටවැනි පිටුව බලන්න.

**8.** **එක්කෝ (A)** කොටසට **නැතහොත් (B)** කොටසට පමණක් පිළිතුරු සපයන්න.

**(A)** ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 14යි)

**(B)** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලිකාංග පරීක්ෂා කරන්න. (ලකුණු 14යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) දඹදෙණි යුගයේ සාහිත්‍යය

(ii) ආර්ය චක්‍රවර්ති පෙළපත

(iii) හයවන පරාක්‍රමබාහු රජතුමා

(iv) සීතාවක රාජධානිය

(v) පොන්නම්බලම් අරුණාචලම්

(vi) නිදහස් ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මාන්තය පිළිබඳ ප්‍රතිපත්තිය

(එක් සටහනකට ලකුණු **07** බැගින්)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ඉතිහාසය I
வரலாறு I
History I
25 S

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

විභාග අංකය / சுட்டெண் / Index No. ....................................



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2016**

ඉතිහාසය II (I කොටස)
வரலாறு II (பகுதி I)
History II (Part I)

**25 - A** **S** **II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**ඉන්දියා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

විභාග අංකය: ......................................

**උපදෙස්:**

- ※ මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- ※ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- ※ මෙම කොටසට ලකුණු **40** ක් දෙනු ලැබේ.
- ※ කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) ජෝන් මාර්ෂල් (2) ආර්. ඩී. බැනර්ජි (3) මෝර්ටිමර් වීලර්
(4) ඒ. එල්. බෂාම් (5) ස්ටුවර්ට් පිගොට් (.........)

**2.** (1) නිල්ගිරි (2) හින්දුකුෂ් (3) වින්ධ්‍යා
(4) ආරවල්ලි (5) සත්පුර (.........)

**3.** (1) චම්බාල් (2) යමුනා (3) ගෝමතී
(4) රාවි (5) ගොග්‍රා (.........)

**4.** (1) රාජගෘහ (2) චම්පා (3) පාටලීපුත්‍ර
(4) සුප්පාරක (5) ප්‍රයාග (.........)

**5.** (1) නාලන්දා (2) වික්‍රමශිලා (3) ජගද්දලා
(4) සෝමනාත් (5) ඕදන්තිපුරි (.........)

**6.** (1) පශුපති (2) ශිව (3) බ්‍රහ්ම
(4) යෝගේශ්වර (5) මහායෝගී (.........)

**7.** (1) නිගණ්ඨනාතපුත්ත (2) පූර්ණකාශ්‍යප (3) මක්කලි ගෝශාල
(4) සාංඛ්‍ය (5) අජිත කේශකම්බල (.........)

**8.** (1) කුමාර සම්භව (2) වික්‍රමෝර්වශී (3) මෘච්ඡකටිකා
(4) ඍතුසංහාර (5) මේඝදූත (.........)

**9.** (1) චෙර (2) පාණ්ඩ්‍ය (3) චන්දෙල්ල
(4) චෝළ (5) පල්ලව (.........)

**10.** (1) මහමුද් බින් කාසිම් (2) සබුක්තිජින් (3) ඝජ්නි මහමුද්
(4) ඝෝර්හි මහමුද් (5) කුටුබ්-උද්-දීන් අයිබෙක් (.........)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ.** එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) තුංගබද්‍රා - බටහිර ඝාට්ස්
(2) නර්මදා - වින්ධ්‍යා
(3) කාවේරි - නිල්ගිරි
(4) රාවි - සුලෙයිමාන්
(5) තප්ති - සත්පුර (.........)

**12.** (1) ගිර්නාර් ශිලාලිපිය - අශෝක
(2) ජුනාගාඩ් ශිලාලිපිය - රුද්‍රදාමන්
(3) නාසික් ශිලාලිපිය - ගෞතමී බාලශ්‍රී
(4) මථුරා ශිලාලිපිය - දෙවන චන්ද්‍රගුප්ත
(5) අයිහෝලේ ශිලාලිපිය - ගෞතමීපුත්‍ර සාතකර්ණී (.........)

**13.** (1) තාරානාථ - චීනය
(2) අල්බිරූනි - අරාබිය
(3) කොස්මස් - බයිසන්තියම
(4) මෙගස්තීනිස් - ග්‍රීසිය
(5) ස්ට්‍රාබෝ - රෝමය (.........)

**14.** (1) මගධ - බිම්බිසාර
(2) ගාන්ධාර - පුක්කුසාති
(3) කෝසල - පසේනදී
(4) අවන්ති - වස්සකාර
(5) වත්ස - උදයන (.........)

**15.** (1) වාතාපිකොණ්ඩ - පළමුවන නරසිංහවර්මන්
(2) සකල උත්තරාපථනාථ - හර්ෂවර්ධන
(3) අමිත්‍රඝාත - අශෝක
(4) දක්ෂිණාපථනාථ - පළමුවන සාතකර්ණී
(5) වික්‍රමාදිත්‍ය - දෙවන චන්ද්‍රගුප්ත (.........)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ. Y** තීරුව, **X** තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ඉන්ද්‍රප්‍රස්ථ | A | ගංගා |
| (ii) | කනෞජ් | B | ගෝධාවරී |
| (iii) | භාරුකච්ඡ | C | යමුනා |
| (iv) | අමරාවතී | D | කෘෂ්ණා |
| (v) | ප්‍රතිෂ්ඨාන | E | නර්මදා |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (.........)

**17.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ඩිමෙට්‍රියස් | A | ඉන්දු-ග්‍රීක |
| (ii) | නහපාන | B | හූණ |
| (iii) | සිමුක | C | සාතවාහන |
| (iv) | තෝරමාන | D | ශක |
| (v) | දන්තිදුර්ග | E | රාෂ්ට්‍රකූට |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (.........)

| | X | | Y |
|---|---|---|---|
| **18.** | (i) සූර්ය සිද්ධාන්ත | A | බාණ |
| | (ii) මත්තවිලාසප්‍රහසන | B | විශාකදත්ත |
| | (iii) මුද්‍රාරාක්ෂස | C | පළමුවන මහේන්ද්‍රවර්මන් |
| | (iv) හර්ෂ චරිත | D | නාගර්ජුන |
| | (v) විභාෂ සූත්‍ර | E | ආර්යභට්ට |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (.........)

| | X | | Y |
|---|---|---|---|
| **19.** | (i) දූර්ගපාල | A | අන්තඃපුර භාර නිලධාරි |
| | (ii) සමාහර්ත | B | බලකොටු භාර නිලධාරි |
| | (iii) සාර්ථවාහ | C | මහා සේනාධිනායක |
| | (iv) මහාදණ්ඩනායක | D | ප්‍රධාන වෙළෙඳ නායක |
| | (v) අන්තර්වසික | E | ප්‍රධාන අයකැමි |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (.........)

| | X | | Y |
|---|---|---|---|
| **20.** | (i) තංජෝරයේ බෘහදීශ්වර දේවාලය | A | හොයිසාල |
| | (ii) එල්ලෝරයේ කෛලාසනාථ දේවාලය | B | චාලුක්‍ය |
| | (iii) බදාමියේ විෂ්ණු මහා දේවාලය | C | රාෂ්ට්‍රකූට |
| | (iv) බෙලූර්හි චෙන්නකේශව දේවාලය | D | පල්ලව |
| | (v) මහබලිපුරම්හි වෙරළේ දේවාලය | E | චෝළ |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (.........)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. ඉන්ඩිකා ග්‍රන්ථයේ කර්තෘ කවරෙක් ද?**
(1) හෙරඩෝටස් (2) ප්ලිනි (3) මෙගස්තිනිස්
(4) කෞටිල්‍ය (5) අල්බිරූනි (.........)

**22. කුෂාණ වංශයේ පළමුවන පාලකයාගේ නම කුමක් ද?**
(1) වීම කුඩ්පයිසිස් (2) කුජුල කුඩ්පයිසිස් (3) කනිෂ්ක
(4) වශිෂ්ක (5) හුවිෂ්ක (.........)

**23. සුදර්ශන ජලාශය පළමුවරට ඉදි කළේ කුමන රජු සමයේ ද?**
(1) චන්ද්‍රගුප්ත මෞර්ය (2) ඛාරවේල (3) ස්කන්ධගුප්ත
(4) රුද්‍රදාමන් (5) පළමුවන සාතකර්ණී (.........)

**24. විශ්වකර්ම ගුහාව පිහිටියේ කොහේ ද?**
(1) එල්ලෝරා (2) අජන්තා (3) භාග්
(4) බදාමි (5) සාරානාත් (.........)

**25. රාෂ්ට්‍රකූටයන්ගේ අගනුවර කුමක් ද?**
(1) මාන්‍යකේත්‍ර (2) මදුරෙයි (3) වාතාපි
(4) තංජෝර් (5) කාවේරි (.........)

- අංක **26** සිට **30** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ**. එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**26. මෞර්ය ප්‍රාදේශීය පාලනය**
(1) අධිරාජ්‍යය පාලන ඒකක කිහිපයකට බෙදා තිබුණි.
(2) අගනුවර අයත් පාලන ඒකකය අගරජුගේ පාලනය යටතේ පැවතිණි.
(3) වැදගත් පාලන ඒකක කුමාරවරුන් විසින් පාලනය කරන ලදී.
(4) වරෙක උජ්ජේනි ප්‍රදේශය අශෝක විසින් පාලනය කරන ලදී.
(5) ප්‍රාදේශීය පාලන ඒකක පාලනය කළ කුමාරවරුන් කුමාරඅමාත්‍ය ලෙස සෙල්ලිපිවල දැක්වේ. (.........)

**27. නන්ද රාජ වංශය**
(1) හර්යංක වංශයෙන් පසු මගධයේ පාලනයට පැමිණියේ නන්ද වංශයයි.
(2) නන්ද වංශයේ ආරම්භක පාලකයා මහාපද්ම නන්ද ය.
(3) පුරාණ ග්‍රන්ථවලට අනුව මහාපද්ම නන්දගේ මව බ්‍රාහ්මණ වංශයට අයත් විය.
(4) මහාපද්ම නන්දගෙන් පසු ඔහුගේ පුතුන් අටදෙනා රජකමට පත්වූහ.
(5) චන්ද්‍රගුප්ත මෞර්ය බලයට පැමිණියේ අන්තිම නන්ද පාලකයා වූ ධනනන්ද මරා දැමීමෙන් පසුව ය. (.........)

**28. පාණ්ඩ්‍යයෝ**

(1) පාණ්ඩ්‍යයන්ගේ අගනුවර තංජෝරය විය.
(2) අසෝක සෙල්ලිපිවලට අනුව එවකට පාණ්ඩ්‍යයෝ ස්වාධීන පාලකයෝ වූහ.
(3) චෝළ පාලක පළමුවන පරන්තක විසින් දෙවන මාරවර්මන් රාජසිංහ පරාජයට පත් කරන ලදී.
(4) පළමුවන පාණ්ඩ්‍ය අධිරාජ්‍යය පිහිටුවන ලද්දේ කඩුන්ගෝන් විසිනි.
(5) ක්‍රි. ව. 1190 දී ජටාවර්මන් කුලසේකර, පාණ්ඩ්‍ය සිංහාසනයට පැමිණීම දෙවන පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ ආරම්භය ලෙස සැලකේ. (.........)

**29. ගුප්ත සංස්කෘතිය**

(1) ගුප්ත යුගයේ දී බොහෝ සාහිත්‍ය කෘති සංස්කෘත භාෂාවෙන් ලියැවුණි.
(2) ආගම, සාහිත්‍යය, කලාව සහ විද්‍යාවේ වර්ධනයට රටේ අභ්‍යන්තර ආරක්ෂාව හා සෞභාග්‍යය හේතු විය.
(3) මෙම යුගයේ දී බ්‍රාහ්මණ ආගම හින්දු ආගම බවට පත් විය.
(4) සාරානාථ් බුදුපිළිමය මෙම යුගයේ උසස් මූර්තියක් ලෙස සැලකේ.
(5) මෙම යුගයේ වඩාත් වන්දනාවට ලක් වූයේ ඉන්ද්‍ර දෙවියන් ය. (.........)

**30. ශිව වන්දනය**

(1) දකුණු ඉන්දියාවේ වඩාත් ජනප්‍රිය වූයේ ශිව දෙවියන් ඇදහීම ය.
(2) බොහෝ පල්ලව හා චෝළ පාලකයෝ ශිව භක්තිකයෝ වූහ.
(3) තංජෝරයේ හා කාංචියේ ශිව දේවාල විශාල ප්‍රමාණයක් දක්නට ලැබේ.
(4) පල්ලවයෝ සහ චෝළයෝ තම රාජ්‍යයන් තුළ වෙනත් ආගම් නොඉවසූහ.
(5) රාමානුජ නම් වෛෂ්ණව ප්‍රතිශෝධකයාට පළමුවන කුලෝත්තුංග රජු සමයේ දී මයිසූරයට පැනයාමට සිදු විය. (.........)

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් .......................................... **1** ද
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් .......................................... **2** ද
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් .......................................... **3** ද
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් .......................................... **4** ද
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් .......... **5** ද **වරහන තුළ** ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් නිවැරදි ය. |

**31. සාහිත්‍ය මූලාශ්‍රය**

(A) පැරණිතම ඉන්දීය සාහිත්‍ය අතිශයින් ම ආගමික ස්වරූපයක් ගනී.
(B) වෛදික සාහිත්‍ය බොහෝ ඓතිහාසික තොරතුරු ලබා දෙයි.
(C) කල්හනගේ රාජතරංගනී කාශ්මීරයේ ඉතිහාසය පිළිබඳ විශ්වසනීය තොරතුරු ඉදිරිපත් කරයි.
(D) විදේශීය ලේඛකයින් අතුරෙන් ඉන්දියාව පිළිබඳ පළමුවෙන් ම තොරතුරු ඉදිරිපත් කරන්නේ හෙරඩෝටස් ය. (.........)

**32. ඍග්වෛදික යුගය**

(A) වැසියා ගෝත්‍ර රාශියකට බෙදී සිටියහ.
(B) මෙම යුගයේ දී ප්‍රධානතම ගෝත්‍ර දෙක වූයේ කුරු සහ පංචාල ය.
(C) ආර්යයෝ දකුණු ඉන්දියාවේ පවා පදිංචිව සිටියහ.
(D) සමාජය වර්ණ හතරකට බෙදීම ගැන ඍග්වේදයේ සඳහන් වේ. (.........)

**33. බිම්බිසාර රජු**

(A) බිම්බිසාර රජු විසින් පාටලීපුත්‍ර නගරය මගධයේ අගනුවර බවට පත් කරන ලදී.
(B) බිම්බිසාර රජු හර්යංක කුලයට අයත් ය.
(C) ඔහු 'ශ්‍රේණිය' (සේනිය) යන විරුදයෙන් ද හැඳින්වේ.
(D) ඔහු තම රාජ්‍ය වර්ධනය කරගත්තේ යුද බලයෙන් පමණි. (.........)

**34. දෙවන චන්ද්‍රගුප්ත**

(A) ඔහු ශකවරු පරදා මාල්වා, ගුජරාටය සහ සෞරාෂ්ට්‍රය තම රාජ්‍යයට ඈඳා ගත්තේ ය.
(B) ඔහු වාකාටකයන් දිනාගත්තේ තම දියණිය රුද්‍රසේන නමැති වාකාටක කුමාරයාට පාවා දීමෙනි.
(C) වයඹදිග ඉන්දියාව ආක්‍රමණය කළ සංචාරක හූණයින් ඔහු විසින් සාර්ථක ලෙස පරාජය කරනු ලැබිණි.
(D) ඔහු ඉන්දියාවට පළමුවෙන් ම රන් කාසි හඳුන්වා දුන් ගුප්ත රජු ලෙස සැලකේ. (.........)

**35. බටහිර චාලුක්‍යයෝ**

(A) බටහිර චාලුක්‍යයන්ගේ අගනුවර වූ වතාපියට පාහියන් හිමියෝ වැඩිය හ.
(B) බටහිර චාලුක්‍ය රජෙකු වූ දෙවන පුලකේෂීන් නර්මදා නදිය අසල දී හර්ෂවර්ධන පරාජය කළේ ය.
(C) පල්ලව රජෙකු වූ පළමුවන නරසිංහවර්මන් විසින් දෙවන පුලකේෂීන් පරාජය කළේ ය.
(D) පළමුවන කුලෝත්තුංග නමැති චෝළ රජු විසින් බටහිර චාලුක්‍ය ප්‍රදේශ සිය රාජ්‍යයට ඈඳා ගන්නා ලදී. (.........)

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ **දෙක** බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා, ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | අංගුත්තර නිකායට අනුව ක්‍රි. පූ. 6 වන සියවසේ දී ඉන්දියාවේ මහා ජනපද දහසයක් විය. | ජනපද දහසය අතුරෙන් එකක් වූයේ ශාක්‍යයන්ගේ කපිලවස්තුවයි. | (.........) |
| **37.** | අසෝක සෙල්ලිපිවල රටවල් නමයකට ධර්ම දූතයන් යැවීම පිළිබඳ ව සඳහන් වේ. | අසෝක සෙල්ලිපිවල සඳහන් වන අයුරු මහින්ද හිමි ශ්‍රී ලංකාවට වැඩම කරවනු ලැබී ය. | (.........) |
| **38.** | ශකවරු වනාහි මධ්‍ය ආසියාවෙන් පැමිණි සංචාරක ගෝත්‍රයකි. | ශකවරුන් යටතේ වූ ප්‍රදේශ ක්ෂත්‍රපවලට බෙදන ලදී. | (.........) |
| **39.** | කුෂාණයන් පන්නා දැමීමෙන් අනතුරුව සාතවාහනයෝ ඩෙකානයේ රාජ්‍යයක් පිහිටුවීමට සමත් වූහ. | ඩෙකානයේ පළමුවෙන් ම අධිරාජ්‍යයක් පිහිටුවන ලද්දේ සාතවාහනයන් විසිනි. | (.........) |
| **40** | සසංකගෙන් පසුව කනෞජය ගුර්ජර - ප්‍රතිහාරයන් අතට පත් විය. | ගුර්ජර - ප්‍රතිහාර වංශික රජෙකු වූ පළමුවන නාගභට විසින් සින්ධිහි අරාබින් පරාජය කරන ලදී. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ඉතිහාසය II (II කොටස)
வரலாறு II (பகுதி II)
History II (Part II)

**25 - A S II**

**ඉන්දියා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

**උපදෙස්:**
※ **පළමුවැනි** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවැනි** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.** ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

(i) ඛයිබර් කපොල්ල (ii) ගෝධාවරි ගඟ
(iii) ප්‍රයාග (iv) සුලෙයිමාන් කඳුවැටිය
(v) උජ්ජේනි (vi) මධුරෙයි
(vii) සුප්පාරක (viii) ඉන්ද්‍රප්‍රස්ථ

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගින්; කෙටි ඓතිහාසික සටහනකට ලකුණු **05** බැගින්.)*

**2.** ඉන්දු-ගංගා නදී මිටියාවත් ඉන්දීය ඉතිහාසය කෙරෙහි ඇති කළ බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 14යි.)

**3.** ඉන්දු නිම්න සභ්‍යත්වය සම්බන්ධයෙන් පහත දැක්වෙන ශීර්ෂ යටතේ සාකච්ඡා කරන්න.
(i) නගර සැලසුම් (ලකුණු 07යි.)
(ii) සභ්‍යත්වයේ බිඳවැටීම (ලකුණු 07යි.)

**4.** ක්‍රි.පූ. හයවැනි සියවසේ උතුරු ඉන්දියාවේ ආගමික චින්තනයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 14යි.)

**5.** "මෞර්ය අධිරාජ්‍යයේ පිරිහීමට අසෝකගේ ප්‍රතිපත්තිය ඉවහල් විය."
(i) මෞර්ය වංශයේ අවසන් පාලකයා කවරෙක් ද? (ලකුණු 01යි.)
(ii) මෞර්යන්ගෙන් රාජ්‍ය බලය පැහැරගත් පාලකයාගේ නම හා ඔහුගේ රාජවංශය නම් කරන්න. (ලකුණු 02යි.)
(iii) රටවැසියන්ගේ සදාචාර වර්ධනයට අසෝක රජු අනුගමනය කළ ප්‍රතිපත්තිය සැකෙවින් දක්වන්න. (ලකුණු 04යි.)
(iv) ඉහත සඳහන් උධෘතය සමඟ ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. (ලකුණු 07යි.)

**6.** මෞර්ය යුගයෙන් පසු ගුප්ත යුගයේ ආරම්භය දක්වා වයඹදිග ඉන්දියාවේ දේශපාලන තත්ත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 14යි.)

**7.** "සත්‍ය වශයෙන් ම සමුද්‍රගුප්තගේ සම්පූර්ණ කාර්යය යුදමය කටයුත්තකි."
(i) ඔහුගේ යුද ව්‍යාපාරය ගැන දැක්වෙන අභිලේඛනය නම් කරන්න. (ලකුණු 01යි.)
(ii) ඔහුගේ පූර්වප්‍රාප්තිකයා හා අනුප්‍රාප්තිකයා නම් කරන්න. (ලකුණු 02යි.)
(iii) ගුප්ත අධිරාජ්‍යය ව්‍යාප්තියේ ලා සමුද්‍රගුප්තගේ කාර්යභාරය ප්‍රමාණ කරන්න. (ලකුණු 03යි.)
(iv) ඉහත උධෘතය විචාරාත්මකව විභාග කරන්න. (ලකුණු 08යි.)

**8.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ සටහන් ලියන්න.
(i) මහා ඇලෙක්සැන්ඩර් (ii) හර්ෂවර්ධන
(iii) ඝෝරිහි මහමුද් (iv) බෙංගාලයේ පාලවරු

*(එක් සටහනකට ලකුණු **07** බැගින්.)*

**9.** **එක්කෝ** (A) කොටසට **නැතහොත්** (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.
**(A)** හර්ෂවර්ධනගෙන් පසු කනෞජයේ ආධිපත්‍යය උදෙසා ඉන්දියානු පාලකයන් අතර ඇති වූ අරගලය පරීක්ෂා කරන්න. (ලකුණු 14යි.)
**(B)** චෝළයන්ගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 14යි.)

※※※

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ඉතිහාසය II
வரலாறு II
History II
**25-A S**

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. **1**

විභාග අංකය / சுட்டெண் / Index No. ....................................



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | |
|---|---|---|
| ඉතිහාසය II (I කොටස)<br>வரலாறு II (பகுதி I)<br>History II (Part I) | 25-B S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

යුරෝපා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1989 දක්වා

විභාග අංකය: .......................................

**උපදෙස්:**

※ මෙම කොටසේ ප්‍රශ්න **40**ක් ඇත. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
※ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
※ මෙම කොටසට ලකුණු **40** ක් දෙනු ලැබේ.
※ කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස**, **II කොටසේ** පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ**. එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

1. (1) පිරනීස් (2) ඇල්ප්ස් (3) ඇපිනයින්
(4) කැස්පියන් (5) කාර්පේතියන් (.........)

2. (1) අයෝනියන් මුහුද (2) ඊජියන් මුහුද (3) කැරිබියන් මුහුද
(4) අද්‍රියාතික් මුහුද (5) මධ්‍යධරණී මුහුද (.........)

3. (1) සියුස් (2) ඇපොලෝ (3) ඇතීනා
(4) ඇෆ්‍රොඩයිටි (5) මිනර්වා (.........)

4. (1) තේලීස් (2) ඇනක්සිමැන්ඩර් (3) වර්ජිල්
(4) පයිතගරස් (5) ආකිමිඩීස් (.........)

5. (1) පෙරික්ලීස් (2) ක්ලෝඩියස් (3) ඩයක්ලීෂියන්
(4) කොන්ස්ටන්ටයින් (5) තියඩෝසියස් (.........)

6. (1) හිපොක්‍රටීස් (2) පැරසෙල්සස් (3) මයිකල් සර්වේටස්
(4) තොමස් මුවර් (5) විලියම් හාවේ (.........)

7. (1) හෙරඩෝටස් (2) සොෆොක්ලීස් (3) තුසිඩිඩීස්
(4) ලිවි (5) ටැසිටස් (.........)

8. (1) අමෙරිගෝ වෙස්පුචි (2) වස්කෝ ද බැල්බෝවා (3) හර්නැන්ඩෝ කෝර්ටීස්
(4) ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ (5) ෆ්‍රැන්සිස් ඩ්‍රේක් (.........)

9. (1) කැලෝන් (2) මිරාබෝ (3) ලෆායට්
(4) අබෙ සියෙස් (5) රොබෙස්පියර් (.........)

10. (1) වී. අයි. ලෙනින් (2) මැක්සිම් ගෝර්කි (3) ජෝශප් ස්ටාලින්
(4) නිකිතා කෲෂෙෆ් (5) ඇලෙක්සි කොසිගින් (.........)

[දෙවැනි පිටුව බලන්න.

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) පෙලපොනීසියානු යුද්ධය - ඇතන්ස් සහ ස්පාර්ටා
(2) පියුනික් යුද්ධ - රෝමය සහ කාර්තේජය
(3) කුරුස යුද්ධ - ක්‍රිස්තියානි භක්තිකයන් සහ මුස්ලිම්වරුන්
(4) සියක් අවුරුදු යුද්ධය - එංගලන්තය සහ ප්‍රංශය
(5) අමෙරිකන් නිදහස් සටන - අමෙරිකාව සහ ස්පාඤ්ඤය (.........)

**12.** (1) ප්ලේටෝ - ඇකඩමි
(2) ඇරිස්ටෝටල් - ලයිසියම්
(3) තොමස් ඇක්වයිනාස් - සුම්මා තියොලොජිකා
(4) ඉරාස්මස් - මුඪත්වයේ අගය වැනීම (Praise of Folly)
(5) මාටින් ලූතර් - දෙවියන්ගේ නගරය (City of God) (.........)

**13.** (1) හැප්ස්බර්ග් - ඔස්ට්‍රියාව
(2) බූර්බන් - ප්‍රංශය
(3) බ්‍රැගන්සා - පෘතුගාලය
(4) ඔරෙන්ජ් - ඉතාලිය
(5) රොමනොෆ් - රුසියාව (.........)

**14.** (1) ලොලාර්ඩ්වාදීන් - එංගලන්තය
(2) හසයිට්වරු - බොහිමියාව
(3) කැල්වින්වාදීන් - ග්‍රීසිය
(4) ඇනාබැප්ටිස්ට්වරු - ජර්මනිය
(5) හ්‍යුගනෝවරු - ප්‍රංශය (.........)

**15.** (1) පෘතුගාලය - බ්‍රසීලය
(2) ස්පාඤ්ඤය - මෙක්සිකෝව
(3) නෙදර්ලන්තය - පිලිපීන දූපත්
(4) එංගලන්තය - ඉන්දියාව
(5) ප්‍රංශය - ඉන්දු-චීනය (.........)

- අංක **16** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ**. **Y** තීරුව, **X** තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| X | Y |
|---|---|
| (i) පාර්තිනොන් | A මොස්කව් |
| (ii) කොලොසියම් | B පැරිස් |
| (iii) ශාන්ත පීටර් බැසිලිකාව | C රෝමය |
| (iv) ක්‍රෙම්ලින් | D ඇතන්ස් |
| (v) අයිෆල් කුලුන | E වතිකානුව |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

**17.**

| X | Y |
|---|---|
| (i) හෙරක්ලීටස් | A 'පාලකයා, සිංහයාත් සිවලාත් අනුකරණය කළ යුතු ය.' |
| (ii) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ | B 'එක ම ගංගාවට දෙවරක් පා තැබිය නොහැකි ය.' |
| (iii) නිකොලෝ මකියාවෙලී | C 'මිනිසා නිදහස්ව උපත ලබා ඇති නමුත් ඔහු හැමතැන ම යදමින් බැඳ තබා ඇත.' |
| (iv) ජීන් ජැක් රූසෝ | D 'සියලු රටවල කම්කරුවනි, එක්වන්න!' |
| (v) කාල් මාක්ස් | E 'සීසර්ගේ දේ සීසර්ටත්, දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් ලබා දෙන්න.' |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

**18.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | මිලාන් ආඥාව | A | කතෝලික ආගම, ප්‍රංශ ජනතාවගේ බහුතරයකගේ ආගම ලෙස පිළිගැනීම |
| (ii) | ඔග්ස්බර්ග් සාම ගිවිසුම | B | නිත්‍යානුකූලවාදය පිළිබඳ මූලධර්මය |
| (iii) | 1801 කොන්කෝඩට් සම්මුතිය | C | ක්‍රිස්තියානින්ට ආගමික නිදහස ප්‍රදානය කිරීම |
| (iv) | වියනා සම්මේලනය | D | ජාතික ස්වයං තීරක අයිතිය පිළිබඳ මූලධර්මය |
| (v) | වර්සායි ගිවිසුම | E | 'යමෙක් රාජ්‍ය කරයි ද, ඔහුගේ ආගම රටවැසියාගේ ද ආගම විය යුතු ය.' |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (………)

**19.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | මසචියෝ | A | අවසාන විනිශ්චය |
| (ii) | බොටිචෙලි | B | ඇතන්ස්හි පාසල |
| (iii) | ලෙනාර්ඩෝ ඩා වින්චි | C | වීනස්ගේ උපත |
| (iv) | මයිකලාංජලෝ | D | ආදම් සහ ඒව උද්‍යානයෙන් නෙරපීම |
| (v) | රෆායල් | E | අවසාන රාත්‍රී භෝජන සංග්‍රහය |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (………)

**20.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | එස්ටේට්ස් ජෙනරල් | A | රුසියාව |
| (ii) | කෝර්ටීස් | B | අමෙරිකා එක්සත් ජනපදය |
| (iii) | ඩූමා | C | ප්‍රංශය |
| (iv) | කොංග්‍රසය | D | ජර්මනිය |
| (v) | රයිෂ්ටාග් | E | ස්පාඤ්ඤය |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (………)

**21.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ජෝන් කැල්වින් | A | නීතියේ සාරය |
| (ii) | තොමස් හොබ්ස් | B | මිනිස් අයිතිවාසිකම් |
| (iii) | මොන්ටෙස්කියු | C | ජාතීන්ගේ ධනය |
| (iv) | ඇඩම් ස්මිත් | D | ලෙවියතාන් |
| (v) | තොමස් පේන් | E | ක්‍රිස්තියානි ආගමේ ආයතන |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (………)

**22.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | උත්කෘෂ්ට විප්ලවය | A | නිදහස, සමානාත්මතාව, සහෝදරත්වය |
| (ii) | අමෙරිකානු විප්ලවය | B | බුද්ධිමතුන්ගේ විප්ලවය |
| (iii) | ප්‍රංශ විප්ලවය | C | රජු අභිබවා පාර්ලිමේන්තුව බලය වර්ධනය කර ගැනීම |
| (iv) | 1848 විප්ලවය | D | සාමය, ඉඩම් සහ පාන් |
| (v) | රුසියන් විප්ලවය | E | 'නියෝජිතයන් නැති නම් බදුත් නැත.' |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (………)

**23.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | රොබට් වෝල්පෝල් | A | එක්සත් ජර්මනියේ ප්‍රථම චාන්සලර්වරයා |
| (ii) | ජෝර්ජ් වොෂිංටන් | B | එංගලන්තයේ ප්‍රථම අගමැතිවරයා |
| (iii) | ඔටෝ ෆොන් බිස්මාර්ක් | C | ප්‍රංශයේ පස්වැනි සමූහාණ්ඩුවේ ප්‍රථම ජනාධිපතිවරයා |
| (iv) | චාල්ස් ඩි ගෝල් | D | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රථම ආසියාතික මහලේකම්වරයා |
| (v) | ඌ තාන් | E | අමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (………)

**24.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | වර්සායි ගිවිසුම | A | හංගේරියාව |
| (ii) | ශාන්ත ජර්මේන් ගිවිසුම | B | තුර්කිය |
| (iii) | නියුලි ගිවිසුම | C | ඔස්ට්‍රියාව |
| (iv) | ට්‍රියනොන් ගිවිසුම | D | ජර්මනිය |
| (v) | ලොසැන් ගිවිසුම | E | බල්ගේරියාව |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (………)

| | X | | Y |
|---|---|---|---|
| **25.** | (i) මාර්ෂල් ටිටෝ | A | ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ ප්‍රථම චාන්සලර්වරයා |
| | (ii) ක්ලෙමන්ට් ඇට්ලි | B | සෝවියට් දේශයේ අවසාන පාලකයා |
| | (iii) කොන්රාඩ් ඇඩිනුවර් | C | පෝලන්තයේ 'සොලිඩැරිටි' නම් කම්කරු සමිතියේ නායකයා |
| | (iv) ලෙච් වලෙසා | D | යුගෝස්ලාවියාවේ ජනාධිපතිවරයා |
| | (v) මිහායල් ගොර්බචොෆ් | E | දෙවන ලෝක යුද්ධයෙන් පසු එංගලන්තයේ ප්‍රථම අගමැතිවරයා |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ......... **5** ද **වරහන තුළ** ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් නිවැරදි ය |

**26. පහත දැක්වෙන ආණ්ඩුක්‍රම අතුරෙන් පුරාණ රෝමවරුන් අතර ප්‍රචලිත ව පැවති ආණ්ඩුක්‍රම කවරේ ද?**

(A) කතිපයාධිපති ආණ්ඩුව (B) රාජාණ්ඩුව
(C) අධිරාජ්‍ය ආණ්ඩුක්‍රමය (D) ප්‍රජා පීඩක පාලනය (.........)

**27. පහත දැක්වෙන ජාතීන් අතුරෙන් බටහිර රෝම අධිරාජ්‍යය ආක්‍රමණය කළ ම්ලේච්ඡ ගෝත්‍ර මොනවා ද?**

(A) ෆීනීෂියන්වරු (B) ලිඩියන්වරු
(C) විසිගොත්වරු (D) වැන්ඩල්වරු (.........)

**28. පහත දැක්වෙන දෑ අතුරෙන් ප්‍රතිරෙපරමාදුවේ ප්‍රධාන අංග කවරේ ද?**

(A) ජේසු සංගමය
(B) ජිනීවාහි කැල්වින්වාදී පල්ලිය
(C) ට්‍රෙන්ට් සම්මේලනය
(D) අධර්ම මර්දනාධිකරණය (.........)

**29. පහත දැක්වෙන්නන් අතුරෙන් වියනා සම්මේලනයට සහභාගි වූ යුරෝපීය නායකයෝ කවරහු ද?**

(A) මෙටර්නික් (B) නෙකර්
(C) කාසල්රී (D) මැසිනි (.........)

**30. ජාතීන්ගේ සංගමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) පළමුවන ලෝක යුද්ධයෙන් පසු ජාතීන්ගේ සංගමය පිහිටුවන ලදී.
(B) ජාතීන්ගේ සංගමයේ ප්‍රධාන අරමුණ වූයේ ජාත්‍යන්තර ගැටුම් විසඳීම සහ යළි යුද්ධයක් ඇති වීම වළක්වා ගැනීමයි.
(C) අමෙරිකා එක්සත් ජනපදය ජාතීන්ගේ සංගමයේ ප්‍රධාන සාමාජිකයකු විය.
(D) ජාතීන්ගේ සංගමය, ඉතාලිය විසින් ඇබිසීනියාව ආක්‍රමණය කිරීම වැළැක්වීමට සමත් විය. (.........)

● අංක **31** සිට **35** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට **නොගැළපේ**. එම **නොගැළපෙන** කරුණ තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31. පුනරුදයේ ප්‍රධාන ලක්ෂණ කවරේ ද?**

(1) සම්භාව්‍ය ග්‍රීක හා රෝම සංස්කෘතියේ පුනර්ජීවනය
(2) සාහිත්‍යය හා කලාවන් පිළිබඳ ලෞකික දෘෂ්ටිය
(3) මානවවාදය
(4) මාටින් ලූතර්ගේ අනුග්‍රහය
(5) පුනරුදය, ඉතාලියේ සිට යුරෝපයේ අන් රටවලට පැතිරයාම (.........)

**32.** **දේශ ගවේෂණ ව්‍යාපාරයේ අවස්ථා**

(1) නාවික හෙන්රි කුමරු ශාඛ්‍යාලයේ මුල්කාලීන මුහුදු ගවේෂණ ගමන්වලට අනුග්‍රහ දැක්වීම
(2) ක්‍රිස්ටෝෆර් කොලම්බස් 1492 දී කැරිබියන් දූපත්වලට ගොඩබැසීම
(3) වස්කෝ ද ගාමා ස්පාඤ්ඤ පාලකයන්ගේ අනුග්‍රහය යටතේ මුහුදු යාත්‍රික ගමන්වල නිරත වීම
(4) වස්කෝ ද ගාමා ආසියාවට පැමිණිය හැකි සාගරබද මාර්ගයක් සොයා ගැනීම
(5) 1520 - 1521 දී ෆර්ඩිනන්ඩ් මැගලන්ගේ සෙබළුන් ලෝකය වටා යාත්‍රා කිරීම (.........)

**33.** **1848 දී විප්ලව ඇති වූ රටවල්**

(1) ප්‍රංශය (2) ඉතාලිය (3) ජර්මනිය
(4) ඔස්ට්‍රියාව (5) රුසියාව (.........)

**34.** **ඉතාලි එක්සත් ව්‍යාපාරයේ අවස්ථා**

(1) පීඩ්මොන්ට්-සාර්ඩිනියා රාජ්‍යය ඉතාලි එක්සත් ව්‍යාපාරයේ නායකත්වය ගැනීම
(2) 1850 දී මැසිනි පීඩ්මොන්ට්-සාර්ඩිනියා රාජ්‍යයේ ප්‍රධාන ඇමති බවට පත් වීම
(3) 1859 දී ඔස්ට්‍රියානු-සාර්ඩිනියානු යුද්ධය
(4) ගැරිබෝල්ඩි විසින් දකුණු ඉතාලිය නිදහස් කර ගනු ලැබීම
(5) 1870 දී ඉතාලි එක්සත්භාවය සාක්ෂාත් කර ගැනීම (.........)

**35.** **දෙවැනි ලෝක යුද්ධයෙන් පසු යුරෝපය**

(1) 1949 දී උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය පිහිටුවන ලදී.
(2) 1949 දී යුරෝපා කවුන්සිලය (Council of Europe) පිහිටුවන ලදී.
(3) 1955 දී වෝර්සෝ සම්මුතිය අත්සන් කරන ලදී.
(4) 1957 දී යුරෝපීය ආර්ථික ප්‍රජාව (European Economic Community) හෙවත් යුරෝපීය පොදු වෙළෙඳපොළ (European Common Market) පිහිටුවන ලදී.
(5) ඩී ගෝල්ගේ ආධාරය ඇතිව බ්‍රිතාන්‍ය යුරෝපීය ආර්ථික ප්‍රජාවට ඇතුළු විය. (.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | පුරාණ ග්‍රීකයෝ යුරෝපයේ බුද්ධිවාදී සහ මානවවාදී සම්ප්‍රදාය ආරම්භ කළ හ. | මහා ඇලෙක්සැන්ඩර් රජතුමා රෝම අධිරාජ්‍යයේ සිටි ශ්‍රේෂ්ඨතම පාලකයා විය. | (.........) |
| **37.** | රොමනෙස්ක් හා ගොතික් ගෘහ නිර්මාණ ශෛලීන් වර්ධනය වූයේ පුනරුද සමයේ දී ය. | ස්වකීය 'ආණ්ඩුව පිළිබඳ සම්මුති දෙක' (Two Treatises of Government) නම් ග්‍රන්ථයෙන් ජෝන් ලොක් අසීමිත බලැති ආණ්ඩුවක් සාධාරණීකරණය කළේ ය. | (.........) |
| **38.** | ආදි තන්ත්‍රය යටතේ පල්ලියේ, හමුදාවේ සහ ආණ්ඩුවේ ඉහළ ම තනතුරු හෙබ වූ ප්‍රංශ රදළ ප්‍රභූ පන්තියේ ආධිපත්‍යය, ප්‍රංශ විප්ලවය විසින් නිම කරන ලදී. | ප්‍රංශ විප්ලව සමය තුළ දී වැඩවසම් අයිතිවාසිකම් සහ වරප්‍රසාද අහෝසි කිරීමත්, ඉඩම් රාජසන්තක කිරීමත් නිසා ප්‍රංශ රදළ ප්‍රභූ පන්තිය හුදු සාමාන්‍ය පුරවැසියන් පිරිසක් බවට පත් විය. | (.........) |
| **39.** | සරයේවෝහි දී ෆ්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් ආදිපාදවරයා ඝාතනය කිරීම, දෙවන ලෝක යුද්ධය ආරම්භ වීමට හේතු වූ ආසන්නතම සිද්ධිය විය. | ජපානය පර්ල් වරායට පහර දීම අමෙරිකා එක්සත් ජනපදය දෙවන ලෝක යුද්ධයට පිවිසීමට හේතු විය. | (.........) |
| **40** | දෙවන ලෝක යුද්ධයෙන් පසු ජර්මනිය, ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව සහ ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව යනුවෙන් රාජ්‍ය දෙකකට බෙදන ලදී. | මිහායිල් ගොර්බචොෆ්ගේ දේශීය හා විදේශීය ප්‍රතිපත්තිය නිරවි යුද්ධය අවසන් කිරීමට හේතු විය. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ඉතිහාසය II (II කොටස)
வரலாறு II (பகுதி II)
History II (Part II)

25-B S II

**යුරෝපා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

**උපදෙස්:**
✳ **පළමුවැනි** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවැනි** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.** ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

| | | |
|---|---|---|
| (i) කෝසිකා | (ii) වියනා | (iii) බෙල්ජියම |
| (iv) පිරනීස් | (v) ලන්ඩන් | (vi) බෝල්ටික් මුහුද |
| (vii) ඩැනියුබ් ගඟ | (viii) ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය | |

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගින්; කෙටි ඓතිහාසික සටහනකට ලකුණු **05** බැගින්)*

**2.** (i) ග්‍රීක පෞර රාජ්‍යවල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. *(ලකුණු 06යි)*
(ii) දර්ශනය හා සාහිත්‍යය යන ක්ෂේත්‍රවල පුරාණ ග්‍රීක කාර්ය සාඵල්‍යය පරීක්ෂා කරන්න. *(ලකුණු 08යි)*

**3.** "දේශපාලන ක්ෂේත්‍රයෙහි යුරෝපය නූතන යුගයට පරිවර්තනය වීම, ජාතික රාජ්‍යයන්ගේ නැගීම මගින් සලකුණු කෙරේ."
(i) ජාතික රාජ්‍යවල නැගීමට තුඩු දුන් හේතු **දෙකක්** දක්වන්න. *(ලකුණු 02යි)*
(ii) ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ සැකෙවින් පරීක්ෂා කරන්න. *(ලකුණු 04යි)*
(iii) ස්පාඤ්ඤයේ **හෝ** එංගලන්තයේ **හෝ** ජාතික රාජ්‍යයේ නැගීමේ ප්‍රධාන අවස්ථා සැකෙවින් දක්වන්න. *(ලකුණු 08යි)*

**4.** "තිස් අවුරුදු යුද්ධය මූලික වශයෙන් ආගමික ගැටුමක් වුව ද, සැලකිය යුතු ප්‍රමාණයක දේශපාලන ගැටුමක් ද ඒ තුළ ගැබ්ව පැවතුණි." තිස් අවුරුදු යුද්ධය ඇති වීමට තුඩු දුන් හේතු සහ එහි ප්‍රධාන අවස්ථා ඇසුරෙන් මෙම කියමන සාකච්ඡා කරන්න. *(ලකුණු 14යි)*

**5.** (i) කාර්මික විප්ලවය මුලින් ම එංගලන්තයේ ආරම්භ වීමට තුඩු දුන් සාධක විග්‍රහ කරන්න. *(ලකුණු 06යි)*
(ii) කාර්මික විප්ලවයෙන් උද්ගත වූ ප්‍රධාන ප්‍රතිඵල පරීක්ෂා කරන්න. *(ලකුණු 08යි)*

**6.** "නැපෝලියන් බොනපාට් ප්‍රංශ විප්ලවයේ කාර්ය සිද්ධීන් බොහොමයක් ඉදිරියට ගෙන ගියේ ය."
(i) නැපෝලියන් බොනපාට් උපන් දිවයින නම් කරන්න. *(ලකුණු 01යි)*
(ii) 1796 දී හා 1797 දී ඔහුගේ නායකත්වය යටතේ ආක්‍රමණය කරන ලද රටවල් **දෙක** නම් කරන්න. *(ලකුණු 02යි)*
(iii) ඔහු ප්‍රංශයේ බලය අත්පත් කර ගත් ආකාරය සැකෙවින් දක්වන්න. *(ලකුණු 03යි)*
(iv) නැපෝලියන් බොනපාට් විසින් ප්‍රංශ විප්ලවයේ කාර්ය සිද්ධීන් කෙතෙක් දුරට ඉදිරියට ගෙන යන ලද්දේ දැයි ඔහුගේ දේශීය ප්‍රතිපත්තිය ඇසුරෙන් විමසන්න. *(ලකුණු 08යි)*

**7.** "බිස්මාක් ජර්මනිය එක්සත් කිරීමේ ප්‍රධාන නිර්මාපකයා විය."
(i) ජර්මනිය එක්සත් කිරීමේ නායකත්වය ගත් රාජ්‍යය නම් කරන්න. *(ලකුණු 01යි)*
(ii) එම රාජ්‍යය යටතේ පිහිටුවා තිබූ තීරු බදු සංගමය නම් කරන්න. *(ලකුණු 01යි)*
(iii) ජර්මනිය එක්සත් කිරීමට එරෙහි ව පැවති බාධක සැකෙවින් දක්වන්න. *(ලකුණු 04යි)*
(iv) එක්සත් ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ජර්මනිය එක්සත් කිරීමෙහිලා බිස්මාක් අනුගමනය කළ ක්‍රියාමාර්ගය විචාරාත්මක ව විමසන්න. *(ලකුණු 08යි)*

[හත්වැනි පිටුව බලන්න.

**8.** (i) 1917 බොල්ෂෙවික් විප්ලවය ඇති වීමට තුඩු දුන් ප්‍රධාන සාධක විග්‍රහ කරන්න. *(ලකුණු 08යි)*

(ii) රුසියාවේ බලය අල්ලා ගැනීමෙන් පසු බොල්ෂෙවික්වරුන් මුහුණ දුන් ප්‍රධාන ගැටලු පරීක්ෂා කරන්න. *(ලකුණු 06යි)*

**9.** **එක්කෝ** **(A)** කොටසට **නැතහොත්** **(B)** කොටසට පමණක් පිළිතුරු සපයන්න.

**(A)** දෙවන ලෝක යුද්ධයෙන් උද්ගත වූ ප්‍රධාන ප්‍රතිඵල කවරේ ද? *(ලකුණු 14යි)*

**(B)** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) 1688 විප්ලවය

(ii) කාඩිනල් රිචලියු

(iii) කැමිලෝ ඩි කැවුර්

(iv) නව අධිරාජ්‍යවාදය

(v) එක්සත් ජාතීන්ගේ සංවිධානය

(vi) නිරවි යුද්ධය

*(එක් සටහනකට ලකුණු* **07** *බැගින්)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ඉතිහාසය II
வரலாறு II
History II

**25-B S**

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. **1**

විභාග අංකය / சுட்டெண் / Index No. ……………………………



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ඉතිහාසය II (I කොටස)
வரலாறு II (பகுதி I)
History II (Part I)

25-C S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා**

විභාග අංකය: ..................................

**උපදෙස්:**

※ මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
※ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
※ මෙම කොටසට ලකුණු **40** ක් දෙනු ලැබේ.
※ කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස**, **II කොටසේ** පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) මධ්‍යධරණී (2) අත්ලාන්තික් (3) අදියාතික්
(4) කැස්පියන් (5) බෝල්ටික් (.........)

**2.** (1) ප්‍රෙස්ටර් ජෝන් (2) ජෝන් වයික්ලිෆ් (3) ජෝන් හස්
(4) මාටින් ලූතර් (5) උල්රිච් ස්විංලි (.........)

**3.** (1) පස්වන නිකොලස් (2) හයවන ඇලෙක්සැන්ඩර් (3) දෙවන ජූලියස්
(4) දහවන ලියෝ (5) පස්වන චාල්ස් (.........)

**4.** (1) ඇංගෝලා (2) මෙක්සිකෝ (3) පීරු
(4) ආර්ජන්ටිනා (5) වෙනිසුවෙලා (.........)

**5.** (1) කාටියර් (2) ඇල්බකර්ක් (3) ජොලියට්
(4) ලා සලේ (5) මාක්වෙටේ (.........)

**6.** (1) බාබූර් (2) හුමායුන් (3) අක්බාර්
(4) ජෙහන්ගීර් (5) නූර් ජහාන් (.........)

**7.** (1) රොබට් ක්ලයිව් (2) ඩුප්ලේ (3) වෙලෙස්ලි
(4) වොරන් හේස්ටිංස් (5) විලියම් බෙන්ටින්ක් (.........)

**8.** (1) ටවුන්ෂෙන්ඩ් (2) ජෝර්ජ් වොෂිංටන් (3) ජෙෆර්සන්
(4) ජේම්ස් ඇඩම්ස් (5) හැමිල්ටන් (.........)

**9.** (1) ජවහර්ලාල් නේරු (2) වල්ලභායි පටෙල් (3) ලාල් බහදූර් ශාස්ත්‍රී
(4) ඉන්දිරා ගාන්ධි (5) මොරාජි දේසායි (.........)

**10.** (1) ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)
(2) උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (NATO)
(3) වෝර්සෝ ගිවිසුම් සංවිධානය (WARSAW)
(4) අග්නිදිග ආසියාතික ගිවිසුම් සංවිධානය (SEATO)
(5) මධ්‍යම ගිවිසුම් සංවිධානය (CENTO) (.........)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක පද එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) නයිල් - අප්‍රිකාව
(2) ඩැනියුබ් - යුරෝපය
(3) ඉරවඩි - ඉන්දියාව
(4) ඇමසන් - දකුණු අමෙරිකාව
(5) මිසිසිපි - උතුරු අමෙරිකාව (………)

**12.** (1) බර්තෝලමියු ඩයස් - අප්‍රිකාවේ දකුණු තුඩුවට යාත්‍රා කිරීම
(2) ක්‍රිස්ටෝෆර් කොලම්බස් - කැරිබියන් දූපත්වලට ගොඩබැසීම
(3) වස්කෝ ද ගාමා - ආසියාවට පැමිණීම සඳහා මුහුදු මාර්ගයක් සොයා ගැනීම
(4) පේද්‍රෝ අල්වාරේස් කබ්රාල් - නව ලෝකය සොයා ගැනීම
(5) වස්කෝ ද බැල්බෝවා - පැසිෆික් සාගරය සොයා ගැනීම (………)

**13.** (1) ක්‍රිස්තියානි ආගමේ ආයතන (Institutes) - ජෝන් කැල්වින්
(2) ලෙවියතාන් (Leviathan) - තොමස් හොබ්ස්
(3) නීතියේ සාරය (Spirit of the Laws) - ජීන් ජැක් රූසෝ
(4) ජාතීන්ගේ ධනය (Wealth of Nations) - ඇඩම් ස්මිත්
(5) මිනිස් අයිතිවාසිකම් (Rights of Man) - තොමස් පේන් (………)

**14.** (1) දාහතරවන ලුවී - "රජය යනු මම වෙමි."
(2) නැපෝලියන් බොනපාට් - "විප්ලවය යනු මම වෙමි."
(3) ඔටෝ ෆොන් බිස්මාර්ක් - "තත්කාලීන වැදගත් ප්‍රශ්න විසඳනු ලබන්නේ කථා පැවැත්වීමෙන් හෝ බහුතර ඡන්දයෙන් හෝ නොව ලෙයින් සහ යකඩෙනි."
(4) මහත්මා ගාන්ධි - "හරිජනයෝ දෙවියන්ගේ දරුවෝ ය."
(5) ෆිඩෙල් කස්ත්‍රෝ - මහා ඉදිරි පිම්ම
(………)

**15.** (1) මොහොමඩ් අලි ජින්නා - පකිස්තානය
(2) ඌ නු - බුරුමය
(3) රමෝන් මැග්සේසේ - පිලිපීනය
(4) ලී ක්වාන් යූ - වියට්නාමය
(5) අබ්දුල් නසර් - ඊජිප්තුව (………)

- අංක **16** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ. Y** තීරුව, **X** තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| X | Y |
|---|---|
| (i) බීජිං | A තායිලන්තය |
| (ii) රැන්ගූන් | B පකිස්තානය |
| (iii) බැංකොක් | C පිලිපීනය |
| (iv) මැනිලා | D චීනය |
| (v) ඉස්ලාමාබාද් | E බුරුමය |

(1) DECAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (………)

**17.**

| X | Y |
|---|---|
| (i) ඔග්ස්බර්ග් සාම සමයය | A නීත්‍යානුකූල හිමිකම් පිළිබඳ මූලධර්මය |
| (ii) නැන්ටීස් ආඥාව | B ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව පවත්වාගෙන යාම |
| (iii) වියනා සම්මේලනය | C ජාතික ස්වයං තීරක අයිතිය පිළිබඳ මූලධර්මය |
| (iv) වර්සායි ගිවිසුම | D ප්‍රංශ ප්‍රොතෙස්තන්තවාදීන්ට ආගමික සහනශීලීත්වය ප්‍රදානය කිරීම |
| (v) එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය | E "යමෙක් රාජ්‍ය කරයි ද ඔහුගේ ආගම රටවැසියාගේ ද ආගම විය යුතු ය." |

(1) DECAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (………)

| | X | Y |
|---|---|---|
| **18.** | (i) බූර්බන් | A ජපානය |
| | (ii) ඔරෙන්ජ් | B ප්‍රංශය |
| | (iii) ටොකුගාවා | C චීනය |
| | (iv) මැංචු | D වියට්නාමය |
| | (v) න්ගුයෙන් | E නෙදර්ලන්තය |

(1) DECAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

| | X | Y |
|---|---|---|
| **19.** | (i) උත්කෘෂ්ට විප්ලවය | A මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශනය |
| | (ii) අමෙරිකන් විප්ලවය | B මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය |
| | (iii) ප්‍රංශ විප්ලවය | C නිර්ධන පන්ති ආඥාදායකත්වය |
| | (iv) බොල්ෂෙවික් විප්ලවය | D අයිතිවාසිකම් පනත |
| | (v) එක්සත් ජාතීන්ගේ සංවිධානය | E ස්වාධීනතා ප්‍රකාශනය |

(1) DECAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

| | X | Y |
|---|---|---|
| **20.** | (i) රාම් මෝහන් රෝයි | A ඉන්දියානු හෝම් රූල් සංගමය |
| | (ii) දයානන්ද සරස්වතී | B ස්වරාජ් පක්ෂය |
| | (iii) ඇනී බෙසන්ට් | C රාමක්‍රිෂ්ණ මිෂන් |
| | (iv) ස්වාමි විවේකානන්ද | D ආර්ය සමාජ් |
| | (v) මෝතිලාල් නේරු | E බ්‍රහ්මෝ සමාජ් |

(1) DECAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

| | X | Y |
|---|---|---|
| **21.** | (i) ලියෝ තෝල්ස්තෝයි | A ගීතාංජලී |
| | (ii) වික්ටර් හියුගෝ | B යුද්ධය හා සාමය (War and Peace) |
| | (iii) රබීන්ද්‍රනාත් තාගෝර් | C මහල්ලා සහ මුහුද (Old Man and the Sea) |
| | (iv) අර්නස්ට් හෙමිංවේ | D හුණු වටයේ කථාව (Caucasian Chalk Circle) |
| | (v) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | E මනුතාපය (Les Miserables) |

(1) DECAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

| | X | Y |
|---|---|---|
| **22.** | (i) ඇල්ජීරියාව | A බ්‍රිතාන්‍ය |
| | (ii) ලිබියාව | B බෙල්ජියන් |
| | (iii) නයිජීරියාව | C පෘතුගීසි |
| | (iv) මොසැම්බික් | D ප්‍රංශ |
| | (v) කොංගෝව | E ඉතාලි |

(1) DECAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

| | X | Y |
|---|---|---|
| **23.** | (i) වී. අයි. ලෙනින් | A බටහිර සමග සාමකාමී සහජීවනය |
| | (ii) ලියොන් ට්‍රොට්ස්කි | B ග්ලස්නොස්ට් (විවෘතභාවය) සහ පෙරෙස්ත්‍රොයිකා (ආර්ථික ප්‍රතිව්‍යුහකරණය) |
| | (iii) ජෝශප් ස්ටාලින් | C තනි රටේ සමාජවාදය |
| | (iv) නිකිතා කෘෂෙෆ් | D නව ආර්ථික ප්‍රතිපත්තිය |
| | (v) මිහායල් ගොර්බචොෆ් | E නොනවතින විප්ලවය |

(1) DECAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

| | X | Y |
|---|---|---|
| **24.** | (i) සියම | A ඉරාකය |
| | (ii) පර්සියාව | B තායිලන්තය |
| | (iii) මෙසොපොටේමියාව | C තායිවානය |
| | (iv) ෆෝර්මෝසා | D මියන්මාරය |
| | (v) බුරුමය | E ඉරානය |

(1) DECAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

[හතරවැනි පිටුව බලන්න.

| | X | | Y |
|---|---|---|---|
| **25.** | (i) ඝානා | A | ජූලියස් නියරේරේ |
| | (ii) කෙන්යා | B | කෙනත් කවුන්ඩා |
| | (iii) ටැන්සානියා | C | ක්වාමේ නික්රූමා |
| | (iv) සැම්බියා | D | හේස්ටිංස් බන්ඩා |
| | (v) මලාවි | E | ජෝමෝ කෙන්යාටා |

(1) DECAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

- අංක **26** සිට **30** තෙක් සෑම ප්‍රශ්නයකට ම නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**26. ස්පාඤ්ඤ අනුග්‍රහය යටතේ ප්‍රථමවරට ලෝකය වටා යාත්‍රා කළා යැයි සැලකෙන්නේ කවු ද?**
(1) නාවික හෙන්රි (2) ජෝන් කැබෝ
(3) අමෙරිගෝ වෙස්පුචි (4) ෆර්ඩිනන්ඩ් මැගලන් (.........)
(5) හෙන්රි හඩ්සන්

**27. ජේසු සංගමය පිහිටුවන ලද්දේ කවුරුන් විසින් ද?**
(1) ඉරාස්මස් (2) මාටින් ලූතර්
(3) උල්රිච් ස්විංලි (4) ජෝන් කැල්වින්
(5) ඉග්නේෂස් ලොයොලා (.........)

**28. සාපේක්ෂවාදී න්‍යාය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?**
(1) අයිසැක් නිවුටන් (2) චාර්ල්ස් ඩාර්වින්
(3) සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් (4) ඇල්බට් අයින්ස්ටයින්
(5) ආර්නෝල්ඩ් ටොයින්බි (.........)

**29. බංග්ලාදේශයේ පළමුවන අගමැතිවරයා කවු ද?**
(1) සුල්ෆිකාර් අලි භූතෝ (2) ෂීක් මුජිබර් රහමන්
(3) සියාඋර් රහමන් (4) ෂීක් මුහම්මද් අබ්දුල්ලා
(5) හුසේන් මුහම්මද් එර්ෂාඩ් (.........)

**30. බ්‍රිතාන්‍යයේ පළමුවන කාන්තා අගමැතිනිය කවු ද?**
(1) රෝසා ලක්සෙම්බර්ග් (2) ගෝල්ඩා මියර්
(3) මාගරට් තැචර් (4) මැඩලීන් ඕල්බ්‍රයිට්
(5) ඇන්ජෙලා මර්කල් (.........)

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,
**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ......................................... **1** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ......................................... **2** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ......................................... **3** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ......................................... **4** ද,
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් .......... **5** ද **වරහන තුළ** ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් නිවැරදි ය. |

**31. පහත දැක්වෙන කරුණු අතුරෙන් ප්‍රති රෙපරමාදුවේ අංග ලක්ෂණ කවරේ ද?**
(A) කතෝලික පල්ලියෙන් ලූතර් නෙරපමින් පාප් වහන්සේ නිකුත් කළ නියෝගය
(B) ට්‍රෙන්ට් සම්මේලනය
(C) අධර්ම මර්දනාධිකරණය
(D) වෙස්ට්ෆේලියා සාම ගිවිසුම (.........)

**32. පෙරදිග ලන්දේසි අධිරාජ්‍යය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) යාන් පීටර්සෝ කුන් පෙරදිග ලන්දේසි අධිරාජ්‍යයේ නිර්මාතෘවරයා ලෙස සලකනු ලැබේ.
(B) පෙරදිග ලන්දේසි අධිරාජ්‍යයේ මූලස්ථානය බතාවියාවේ ස්ථාපිත කොට තිබුණි.
(C) 1571 දී ලන්දේසීහු පිලිපීන දූපත් ජයගත්හ.
(D) 1796 දී බ්‍රිතාන්‍යයන් විසින් ලන්දේසීන් ජාවා දිවයිනෙන් පළවා හරිනු ලැබී ය. (.........)

**33.** **පහත දැක්වෙන්නන් අතුරෙන් ඉන්දුනීසියාවේ ජනාධිපතිවරු කවරහු ද?**

(A) සුකර්ණෝ (B) සුහර්තෝ

(C) තුන්කු අබ්දුල් රහමන් (D) මහතීර් මොහමඩ් (………)

**34.** **පහත දැක්වෙන්නන් අතුරෙන් ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ චාන්සලර්වරු කවරහු ද?**

(A) ට්‍රිග්වි ලී (B) ඩැග් හැමර්ෂල්

(C) කොන්රාඩ් ඇඩිනුවර් (D) විලී බ්‍රාන්ට් (………)

**35.** **සීතල යුද්ධය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) අමෙරිකා එක්සත් ජනපදයේ හා සෝවියට් දේශයේ නායකත්වයෙන් යුත් බල කඳවුරු දෙක අතර පැවති දෘෂ්ටිවාදීමය, දේශපාලන හා රාජ්‍ය තාන්ත්‍රික ගැටුම සීතල යුද්ධය යන්නෙන් අදහස් කෙරේ.

(B) උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය 1949 දී පිහිටුවන ලදී.

(C) සෝවියට් දේශය හා එහි පරිවාර රාජ්‍ය අතර 1955 දී වෝර්සෝ ගිවිසුම අත්සන් කරන ලදී.

(D) මිහායිල් ගොර්බචොෆ් බලයට පත් වීමෙන් පසු සීතල යුද්ධය තීව්‍ර වීමට පටන් ගත්තේ ය. (………)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | 1602 දී ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම පිහිටුවන ලදී. | අබිං යුද්ධය අවසානයේ 1842 දී බ්‍රිතාන්‍යයෝ බුරුමය ජයගත්හ. | (………) |
| **37.** | පාර්ලිමේන්තුවේ නියෝගය මත 1649 දී පළමුවන චාල්ස් රජතුමා මරණයට පත් කරන ලදී. | උත්කෘෂ්ට විප්ලවය දහඅටවන සියවසේ අග ඇති වූ අමෙරිකන් හා ප්‍රංශ විප්ලව කෙරෙහි විශාල බලපෑමක් ඇති කළේ ය. | (………) |
| **38.** | 1857 ජනතා නැගී සිටීම බ්‍රිතාන්‍ය ඉන්දියාවේ ඉතිහාසයේ වැදගත් පරිවර්තනීය අවධියක් සලකුණු කරයි. | 1857 ජනතා සටනින් පසු ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමේ පාලනය අවසන් කරන ලද අතර ඉන්දියාවේ පාලනය බ්‍රිතාන්‍ය කිරීටය වෙත පවරා ගනු ලැබී ය. | (………) |
| **39.** | රුසියාවේ සාර් පාලකයා වූ දහසයවන ලුවී රජතුමා රුසියානු විප්ලව සමයේ දී මරණයට පත් කරන ලදී. | ඇලෙක්සැන්ඩර් කෙරන්ස්කි රුසියානු විප්ලවයේ ප්‍රධාන නායකයන් අතුරෙන් කෙනෙක් විය. | (………) |
| **40** | ජපානය මැංචූරියාවට එල්ල කළ ආක්‍රමණය නැවැත්වීමට ජාතීන්ගේ සංගමය සමත් විය. | හිරෝෂිමාවට හා නාගසාකියට න්‍යෂ්ටික බෝම්බ හෙළීමෙන් පසු ජපානය යටත් වීමත් සමඟ දෙවන ලෝක යුද්ධය අවසන් විය. | (………) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ඉතිහාසය II (II කොටස)
வரலாறு II (பகுதி II)
History II (Part II)

25-C S II

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා**

**උපදෙස්:**

※ **පළමුවැනි** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවැනි** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ලෝකයේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න**. ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.
   (i) මධ්‍යධරණී මුහුද (ii) ඇන්ඩීස් කඳුවැටිය (iii) හොවැං හෝ ගඟ (iv) මැඩගස්කරය
   (v) සූවස් ඇළ (vi) කල්කටා (vii) ඉරාකය (viii) නෝර්වේ
   *(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි; කෙටි ඓතිහාසික සටහනකට ලකුණු **05** බැගිනි.)*

2. "පුනරුදය යුරෝපයේ නූතන යුගයේ ආරම්භය සලකුණු කරයි."
   (i) පුනරුදය ආරම්භ වූ රටේ නම කුමක් ද? (ලකුණු 01 යි)
   (ii) පුනරුද සමයෙහි සිටි කලාකරුවන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)
   (iii) 'පුනරුදය' යනු කුමක් දැයි නිර්වචනය කරන්න. (ලකුණු 03 යි)
   (iv) පුනරුදය යුරෝපයේ නූතන යුගයේ ආරම්භය සලකුණු කළ ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)

3. (i) කාර්මික විප්ලවය යුරෝපයේ අනෙකුත් රටවලට පෙර එංගලන්තයේ ඇති වූයේ මන් ද? (ලකුණු 06 යි)
   (ii) කාර්මික විප්ලවයෙන් උද්ගත වූ කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිඵල සාකච්ඡා කරන්න. (ලකුණු 08 යි)

4. "ප්‍රංශ විප්ලව සමය නූතන යුරෝපය හැඩගැස්වීමට බලපෑ තීරණාත්මක අවධියකි."
   (i) 1789 ජූලි 14 දා ප්‍රංශයේ සිදු වූ ප්‍රකට සිද්ධිය නම් කරන්න. (ලකුණු 01 යි)
   (ii) ප්‍රංශ විප්ලවයේ නායකයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)
   (iii) ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන අවස්ථා සැකෙවින් ගෙනහැර දක්වන්න. (ලකුණු 04 යි)
   (iv) ප්‍රංශ විප්ලවය නූතන යුරෝපයේ ඉතිහාසය හැඩගැස්වීමෙහිලා බලපා ඇති අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි)

5. නව අධිරාජ්‍යවාදය පළමුවන ලෝක යුද්ධය ඇතිවීමෙහිලා කෙතෙක් දුරට හේතු වී ද? (ලකුණු 14 යි)

6. ඉන්දියාවේ ජාතික ව්‍යාපාරයෙහිලා මහත්මා ගාන්ධි විසින් ඉටු කරන ලද කාර්යභාරය විචාරාත්මකව විමසන්න. (ලකුණු 14 යි)

7. වියට්නාම් ජාතික ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න. (ලකුණු 14 යි)

8. "චීනයේ කොමියුනිස්ට් ජයග්‍රහණය එරට නූතන සංවර්ධනයේ ආරම්භය සලකුණු කරයි."
   (i) චීන විප්ලවය සිදු වන අවස්ථාවේ කුවෝමින්තාං සංවිධානයේ සිටි නායකයා නම් කරන්න. (ලකුණු 01 යි)
   (ii) 1949 චීන විප්ලවය මෙහෙය වූ චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකයා නම් කරන්න. (ලකුණු 01 යි)
   (iii) චීන විප්ලවය ඇති වීමට තුඩු දුන් පසුබිම සැකෙවින් විග්‍රහ කරන්න. (ලකුණු 05 යි)
   (iv) විප්ලවය ඇති වීමෙන් පසු කොමියුනිස්ට්වරුන් විසින් චීනය සංවර්ධනය කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග විචාරාත්මකව විමසන්න. (ලකුණු 07 යි)

**9.** **එක්කෝ (A)** කොටසට **නැතහොත් (B)** කොටසට පමණක් පිළිතුරු සපයන්න.

**(A)** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **ඕනෑම දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) ස්පාඤ්ඤ යටත් විජිත අධිරාජ්‍යය
(ii) වියනා සම්මේලනය
(iii) මෙයිජි ප්‍රතිෂ්ඨාපනය
(iv) ජර්මනියේ නට්සිවාදය
(v) ජෝශප් ස්ටාලින් යටතේ සෝවියට් දේශය
(vi) එක්සත් ජාතීන්ගේ සංවිධානය

(එක් කෙටි සටහනකට ලකුණු **07** බැගිනි.)

**(B)** කියුබානු විප්ලවයෙහිලා ෆිඩෙල් කැස්ත්‍රෝ විසින් ඉටු කරන ලද කාර්යභාරය විචාරාත්මකව විමසන්න. (ලකුණු 14 යි)

* * *

මෙතැනින් වෙන් කරන්න

AL/2016/25-C/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | | |
|---|---|---|---|
| ඉතිහාසය II<br>வரலாறு II<br>History II | 25-C | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. **1**

විභාග අංකය / சுட்டெண் / Index No. ..............................

